මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමා පාඨමාලාව - 2022/23

(පළමු සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2022 නොවැම්බර්)

# DY 01 - සිංහල භාෂාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න හතරකට (04) පිළිතුරු ලියන්න.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

**1. (අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ප්‍රජාතන්ත්‍රවාදය අහිමි වූ ඒකාධිපති ආණ්ඩු සහිත දුප්පත් රටවලට ජාත්‍යන්තර සහයෝගය ලැබෙන්නේ නැත. මෙ රටවල් පාලන ව්‍යුහයේ වෙනස්කම් සිදුකොට ඒවා සාක්ෂි සමඟ තහවුරු කළ යුතු යැයි හැඟීමක් බලවත් රටවලට හා ඒවා ප්‍රධානකොට ඇති ජගත් ආයතන සතු වෙයි. නිදසුනක් ගතහොත් එක්සත් ජාතීන්ගේ සංවිධානය විවිධ ප්‍රඥප්ති හඳුන්වාදෙමින් ප්‍රජාතන්ත්‍රවාදයට හා මානව නිදහසට මාවත සකස් කර තිබේ. රටක ආණ්ඩුකරණය හා පාලන ව්‍යුහය පිළිබඳ දළ සටහනක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සැලකිය හැකිය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටක මූලික නීතිය ලෙස පවතින අතර ඊට අනුව රාජ්‍ය පාලනය සිදුවෙයි. මේ වන විටත් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන 1978 ව්‍යවස්ථාව රාජ්‍ය නායකයාට අසීමිත බලයක් ලබාදෙන ලියැවිල්ලක් හැටියට විවේචනයට ලක් වෙයි. එම ව්‍යවස්ථාව සම්පාදනය සඳහා ප්‍රංශයේ හිටපු පාලක ඩිගෝල්ගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආදර්ශ ලබාගෙන ඇති බව ප්‍රකට කාරණයකි. ඩිගෝල් යුද සෙනෙවියකු වූ අතර ඔහුගේ විශ්වාසය වූයේ අසීමිත බලයක් නැතිව රටක් ඉදිරියට ගෙන යා නොහැකි බවය. මේ අදහස අදටත් සමහරුන් තුළ පවතී. අපේ ආණ්ඩුකරණය පිළිබඳ ප්‍රසාදයක් ජාත්‍යන්තරය තුළ නැත. එලෙසම දේශීය වශයෙන් ගත් කළ ද ව්‍යවස්ථාව වෙනස් කළ යුතු යැයි ප්‍රබල මතයක් පවතී. එය වරින් වර දේශපාලන කරලියට පැමිණි අතර මේ වන විට විසි දෙවතාවක් ව්‍යවස්ථාව සඳහා සංශෝධන ඉදිරිපත් වී ඇත. අලුත් ම සංශෝධනය ලෙස විසිදෙවන සංශෝධනය සඳහන් කළ හැකිය. එය පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත විය. දෙවන වරට කියැවීමේදී පනතට එරෙහිව එක ඡන්දයක් භාවිත වූ අතර, තෙවන වර කියැවීමේදී පනතට එරෙහිව එක් ඡන්දයක් හෝ භාවිත වූයේ නැත.

1.ඡේදයට අනුව ආණ්ඩුකම ව්‍යවස්ථාව යන්න නිර්වචනය කරන්න.

2.මේ වන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කී වතාවක් සංශෝධනය වී තිබේ ද?

3. 1978 ව්‍යවස්ථාව සම්බන්ධයෙන් ඡේදයේ සඳහන් කරුණු දෙකක් දක්වන්න.

4.ප්‍රජාතන්ත්‍රවාදය අහිමි වූ ඒකාධිපති ආණ්ඩුවල කුමන වෙනස්කම් සිදුවිය යුතු යැයි ජාත්‍යන්තරය අපේක්ෂා කරයි ද?

5. **ව්‍යුහය, සංශෝධන** යන පදවල අර්ථ දක්වන්න.

*(ලකුණු 10)*

**(ආ) පහත සඳහන් ඡේදය වචන 40 - 45 අතර වන ලෙස සාරාංශ කර දක්වන්න.**

මේ අතර ශ්‍රී ලංකාවේ ණය බර වැඩිවී ආර්ථික අර්බුදය තවත් උග්‍රවීමට ඉඩ ඇති බවට ලෝක බැංකුව අනතුරු අඟවා ඇත. මෙරට දුප්පත් ජනතාව ලක්ෂ 27 කින් වැඩිවී ඇති බව ද එම පුවතේම සඳහන් වේ. මේ එක්සත් ජාතීන්ට අයත් සියලු රටවල අවධානය ශ්‍රී ලංකාව වෙත යොමුවී ඇති අවස්ථාවකි. උග්‍රවන ආහාර අනාරක්ෂිතභාවය, ඇඩි ඉන්ධන හිඟය, අත්‍යවශ්‍ය ඖෂධ හිඟය, ගෘහාශ්‍රිත ආදායම අඩුවීම ඇතුළු ආර්ථික අර්බුදයේ මානව හිමිකම් බලපෑම පිළිබඳව එක්සත් ජාතීන්ගේ අපට එරෙහි යෝජනාවල ද සඳහන් වේ. එම යෝජනාවලට අදාළ නිර්දේශවල 71-ආ යටතේ ද ආර්ථික අර්බුද සමයේ ජනතාවගේ ආර්ථික හා සමාජීය අයිතිවාසිකම් සහතික කිරීමට අවශ්‍ය සියලු පියවර ගත යුතු බව ද සඳහන් ය. අප ඉදිරි කාලය තුළ ණය ප්‍රතිව්‍යුහගතකරණය සහ ලෝක ප්‍රජාවගේ ප්‍රසාදය දිනාගත යුතුව තිබේ. රට ආර්ථික හා සමාජීය වශයෙන් ගොඩගැනීමට ලෝක ප්‍රජාව ඉදිරියේ හොඳ නම දිනාගත යුතු ය.මේ කළ වැරදි නිවැරදි කරගත යුතු කාලයක් මිස තවදුරටත් දූෂණ, අක්‍රමිකතා පවත්වා ගැනීමට ඉඩදිය යුතු කාලයක් නොවේ.

*(ලකුණු 20)*

**(ඇ) පහත සඳහන් වාක්‍ය සදොස් නම් පමණක් නිදොස් කර දක්වන්න. නිදොස් වාක්‍ය ඇතොත් අදාළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් නිදොස් යනුවෙන් ලියා දක්වන්න.**

1. කොටියෙක් සාවෙක් අල්ලයි.
2. ආචාර්යවරුන් දේශන මෙහෙයවයි.
3. දෙමාපියෝ කරුණාවන්ත විය යුතු ය.
4. හෙළයේ මහා ගත්කරු නොහොත් මාර්ටින් වික්‍රමසිංහ මහතා විචාර කෘති ද ලියුහ.
5. සිසුන් උනන්දුවෙන් පිළිතුරු ලියනු ඇත.
6. දක්ෂ පාලකයෝ රට සංවර්ධනය කරයි.
7. නළුවෙක් වූ විජය ගීත ගායනය ද ප්‍රිය කළේය.
8. සරච්චන්ද්‍රයෝ ප්‍රකට ගත්කතුවරයෙකු ද වෙති.
9. අපි ඇමතිවරයෙක් හමුවෙමු.
10. මිතුරෝ සමග වන රක්ෂිතයට ගිය ව්‍යාපාරිකයෝ අද උසාවියට පැමිණ නැත.

*(ලකුණු 10)*

**(ඇ) කථන ව්‍යවහාරයේ යෙදෙන පහත සඳහන් වාක්‍ය නිවැරදි ව ලේඛන ව්‍යවහාරයෙන් ලියා දක්වන්න.**

1. මම හෙට ගෙදර යනවා.
2. අම්මා හරි තාත්තා හරි මාව ඉස්කෝලේ එක්කන් යනවා.
3. අපි හොඳට සෙල්ලම් කළා.
4. ඇමතිවරු ඊයේ රෑ දිවුරුම් දුන්නා.
5. එක නළුවෙක් අලුත් චිත්‍රපට දෙකක් ම හැදුවා. *(ලකුණු 5)*

**(ඉ) පහත සඳහන් වචනවල අර්ථ පැහැදිලි වන ලෙස ව්‍යාකරණානුකූල වාක්‍ය සකසන්න.**

1. දාරක ස්නේහය
2. විද්වතා
3. ක්‍රමෝපාය
4. අනනුකූල
5. ස්ථූල

*(ලකුණු 10)*

**2. නූතන සමාජ ක්‍රමය යටතේ දරු - දෙමාපිය සබඳතාව විවිධ ගැටලුවලට මුහුණ දෙන ආකාරය නූතන පද්‍ය තුනක්වත් ඇසුරු කර ගනිමින් පැහැදිලි කරන්න.**

*(ලකුණු 15)*

3. <u>යශෝරාවය</u> නවකතාවෙහි එන වීරසේකර පවුලේ දරුවන්ගේ චරිතවල දැකිය හැකි සංකීර්ණ ලක්ෂණ සනිදර්ශනව සාකච්ඡා කරන්න.

*(ලකුණු 15)*

4. "කෙටිකතා නිර්මාණයේ දී ජී.බී. සේනානායක ප්‍රංශ හා රුසියානු කෙටිකතා රීති අනුගමනය කරන අතර ම ස්වාධීන මාර්ගවලට ද පිවිසෙයි." විමසන්න.

(ලකුණු 15)

5. පහත සඳහන් පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක් ලියන්න.

දෙනෝදහක සේනාවකි මෙහි හැම තැන ගැවසෙන්නේ
උඹ වැනි බිළිඳුන් මෙතැනට සිය දහසිනි පැමිණෙන්නේ
කිමදැයි පුත මගෙ උරමත හිස සඟවා නිදියන්නේ
පැලේ නොවෙයි පුතුනේ උඹ උසාවියක අද ඉන්නේ

උඹ කිසිදා නොදුටු පියා අද මෙහි ඇවිදින් ඉන්නේ
නැත උඹ ඔහුගේ පුතු බව පුතුනේ ඔහු පිළිගන්නේ
උඹ මැදි කොට ඇති නඩුවක අද අප දෙපසේ ඉන්නේ
හඳුනා ගන්නටවත් පුත ඔහු එක දෙස බලපන්නේ

එදා උඹට මගෙ ගත මස ලේ කිරි කරලයි දුන්නේ
මෙදා බතට හඬනා නුඹ කෙලෙසද මා සනසන්නේ
අදයි පුතුනි උඹ මතු කල වැඩෙනා සැටි විසඳෙන්නේ
එවන් නඩුව විසඳෙන සැටි පුත නොනිදා අසපන්නේ

සකුන්තලා බිසව එදා තම පුතු ගැන කියමින්නේ
රජු ළඟ වැළපුණු මොහොතේ පිහිට ලැබුණි දෙවියන්නේ
මොනා දෙවියන්දැයි පුතුනේ අද උඹෙ සරණෙට එන්නේ
පිබිද වහා උඹම හඬා උඹෙ පැමිණිලි කියපන්නේ

(ලකුණු 15)